## I කොටස

01 ✓  02 ✓  03 ✓  04 ×  05 ×

06 පුස්තකාල / පරිගණක  07 සංස්කෘතිය / සංස්කෘතීන්ට  08 ඔසවා / දෙසින්

09 ජාතියක් / සංවර්ධනයට  10 පතන / ශක්තියක්  11 සාමාජිකකයෝ

12 සංස්කෘතිය  13 විමසුම්  14 ඉටුකිරීම  15 සාමාජිකයන්  16 පවුලයි

17 1972  18 අධ්‍යාපනය  19 යුතුකමකි  20 ආත්මාභිමානය

## II කොටස

01 (1) ඇතුල්වීමට පෙර පාවහන් හා හිස්වැසුම් ආදිය ගැලවීම / උසුළු විසුළු කිරීමෙන් වැළකීම / විනීතව හැසිරීම / සන්සුන් ලෙස ආගමික කටයුතුවල යෙදීම

(2) විශ්වාස / ඇඳහිලි / භාෂාව / ආගම / සිරිත් විරිත්

(3) නිල් මානෙල් / නා / වළිකුකුළා / අත්පන්දු

(4) අප රටට වසර 2500 කට වඩා දිගු ඉතිහාසයක් ඇති සංස්කෘතියක් ඇත. / ආර්යන්ගේ පැමිණීම හා බුදු දහමේ ආභාෂයෙන් පෝෂණය වූ දියුනු සිංහල බෞද්ධ සංස්කෘතියක් අපට ඇත. / පසුව පැමිණි දෙමළ ජනයාගේ හින්දු සංස්කෘතියද ශ්‍රී ලංකා සංස්කෘතියට එක්විය / වෙළඳාමට පැමිණි මුස්ලිම් ජනයාගේ ඉස්ලාම් සංස්කෘතික ලක්ෂණ ද, ශ්‍රී ලංකා සංස්කෘතියේ ඇත / බටහිර ජාතීන්ගේ පැමිණීම නිසා ඉංග්‍රීසි, කතෝලික, ක්‍රිස්තියානි ආගම් විවිධ ආහාර පාන, සිරිත් විරිත් ශ්‍රී ලංකා සංස්කෘතියට එක්විය / මේ නිසා ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ බහුජාතික බහුවිධ ලක්සණ සහිත සංස්කෘතියකි.

02 (1) පාර්ලිමේන්තුවේ / රාජ්‍ය ආයතනවල / රාජ්‍ය ලියකියවිලි / රාජ්‍ය වාහනවල / රාජ්‍ය මුද්‍රාවේ

(2) ගල්විහාර සැතපෙන පිළිමය / ඉසුරුමුණි පෙම් යුවල / නටරාජා / මුරගල

(3) ළමුන් රැකියාවල නිරත කරවීම / ළමුන් අපචාරයෙහි යෙදවීම

සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතියක් ඇත. ශ්‍රී ලංකාවේ කිසිදු ළමයෙකු අනිවාර්ය අධ්‍යාපනය අවසන්වීමේ වයස අවුරුදු 14 සම්පූර්ණ වීමට පෙර රැකියාවන්හී යොදවා ගත නොහැක. ළමුන් එසේ රැකියාවල යෙදවීම නිසා ඔවුන්ගේ අධ්‍යාපන අවස්ථා නැතිව යයි. එමෙන්ම ඔවුන්ට දෙමව්පිය රැකවරණය හා ආරක්ෂාව අහිමිවේ. ළමාවියේ නිදහස ද අහිමිවේ.

ළමා අපචාරයෙහි යෙදවීම නිසා ඔවුන්ගේ ලැජ්ජා බිය නැතිව යාම, අනාරක්ෂිත බව, මත්ද්‍රව්‍ය ආදියටත්, සොරකම් හා අපරාධ ආදියටත් ඔවුන් පසුකාලයේ සම්බන්ධ වීම නිසා එය සමාජ උවදුරක් වීම, මේ නිසා ළමයාගේ උපරිම යහපත හා අනන්‍යතාව නැතිව යයි.

03 (1) බෞද්ධ පන්සල / ක්‍රිස්තියානි, කතෝලික පල්ලිය / හින්දු කෝවිල / ඉස්ලාම් කිතුනුවන්ට

(2) බෞද්ධයන්ට / මහා ශිව රාත්‍රි දිනය / නබිනායක තුමාගේ උපන්දිනය / මහා සිකුරාදා දිනය

(3) විවිධ හේතු නිසා ගොඩබිම, ජලය හා වායුව දූෂණය වේ. එහි විපාක එම ප්‍රදේශවලට පමණක් සීමා නොවේ. වායුව හා ජලය මගින් එය මුළු පරිසරය පුරාම ව්‍යාප්ත විය හැක. ඒනිසා සෑම දෙනාගේම යුතුකම වන්නේ ජලය හා වායුව දූෂණය නොවන ආකාරයට කටයුතු කිරීමය.

තමන්ගේ කුණු කසල නිසි පරිදි ඉවත් නොකර වෙනත් ස්ථානවල බහාලීමෙන් ගොඩබිම පමණක් නොව වාතය හා ජලය ද දූෂණය වේ. එහෙයින් අපගේ යුතුකම වන්නේ කුණු කසල නිසිපරිදි ඉවත් කිරීමයි. එය මුළු මහත් සමාජයටම බලපායි.

ගහකොළ විනාශ කිරීමෙන් වර්ෂාව නැතිව යනවා පමණක් නොව සත්ත්ව ලෝකය ද විනාශ වේ. එය අප සැමට බලපායි. ඒනිසා සැමගේ යුතුකම වනාන්තර ආරක්ෂා කර ගැනීම හා පරිසරය අලංකාරව තබාගැනීමයි. මේ නිසා එක් අයෙකුට පමණක් පරිසරය සුරැකිය නොහැකිය. එය අප සැමගේ ප්‍රයත්නයක් විය යුතුය.

04 (1) විදුල්පතිතුමා, තුමිය / ගුරුවරුන් / ශිෂ්‍ය ශිෂ්‍යාවන් / දෙමාපියන්

(2) රූපවාහිනිය / ගුවන්විදුලිය / අන්තර්ජාලය / පුවත්පත්

(3) විශ්වය හා ලෝකය පිළිබඳ දැනුම ලැබීම / දේශීය හා ජාත්‍යන්තර සිදුවීම් දැන ගැනීම / විවිධ විෂයන් පිළිබඳ දැනුම ලැබීම / විවිධ සංස්කෘතීන් පිළිබඳ දැනුම ලැබීම / විනෝදය ලැබීම (කරුණු 3 ක් කෙටියෙන් විස්තර කරන්න.)

05 (1) සාමූහිකත්වය ගොඩනැගීම / පාරම්පරික සිරිත් විරිත් හා සම්ප්‍රදායන් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වීම / එම සිරිත් විරිත් සම්ප්‍රදායන් පවත්වාගෙන යාමේ කුසලතා සංවර්ධනය වීම / එකිනෙකාට උදව් කිරීමේ හා උදව් ලබාගැනීමට අවස්ථාව උදාවීම.

(2) මව, පියා සහ දරුවන් පමණක් එකට ජීවත් වන පවුලක් න්‍යෂ්ටික පවුලක් යනුවෙන් හැඳින්වේ. මව, පියා, දරුවන්, ආච්චී, සීයා, නැන්දා, මාමා ආදී සාමාජිකයින් එකට ජීවත්වන පවුලක් විස්තෘත පවුලක් යනුවෙන් හැඳින්වේ.

(3) පවුලේ විවිධ තරාතිරම්වල සාමාජික සංඛ්‍යාව වැඩිවීම නිසා සාමාජික ශක්තිය වැඩිවීම. / වැඩිමහල්ලන්ට ආරක්ෂාව ලැබීම / වගකීම් බෙදීයාම නිසා ඇතිවන පහසුව හා සැහැල්ලුව / අවට සමාජය සමග වඩාත් පුළුල් සබඳතාවක් ඇතිකර ගත හැකි වීම / පවුලේ ආර්ථික කටයුතු සඳහා මෙන්ම එදිනෙදා කටයුතුවලදී ද පවුල තුළින් ශ්‍රමය සපයාගැනීමට හැකිවීම (කරුණු 3 කෙටියෙන් පැහැදිලි කරන්න.)